(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1999 ජූනි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ජූනි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 9.00 තැපැල් ගාස්තුව : රු. 3.50

[සහතිකය සටහන් කළේ 1999 ජූනි මස 24 වන දින]

එල්.ඩී.—ඕ. 1/97.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කාරණා සඳහා ද, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් ( මෙහි මින් මතු " නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන ) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේය. — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1 වන කොටස

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය

**2.** (1) මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. — සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් ඊට පවරා ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් වන අතර, ඒ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

**3**. (1) අධිකාරියේ කටයුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමණාකරණ මණ්ඩලයක් විසින් පරිපාලනය සහ කළමනාකරණය කරනු ලැබිය යුතු ය. — අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය.

(2) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනකුගෙන්, එනම්,

(i) ක්‍රීඩා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ පත් කරනු ලැබූ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා ;

(iii) භාණ්ඩාගාරයේ නියෝජිතයකු ; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් අටදෙනෙකු (මේ ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ).

(3) මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අධිකාරියේ සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) සභාපතිවරයාගේ සහ මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය, සභාපතිවරයා සහ මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් විසින් ධුර හිස් කිරීම, මණ්ඩලයේ රැස්වීම් සහ අධිකාරියේ මුද්‍රාව සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන අදාළ වන්නේ ය.

(5) මේ පනතින් අධිකාරිය වෙත පවරා දෙන ලද හෝ නියම කරන ලද බලතල සහ කර්තව්‍ය, මණ්ඩලය විසින් ක්‍රියාවේ යෙදවීම හා ඉටු කිරීම කළ යුතු ය.

අධිකාරියේ කර්තව්‍ය.

4. (1) අධිකාරියේ කර්තව්‍ය පහත පරිදි වන්නේ ය :—

(අ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමනාකරණ කිරීම සහ නඩත්තු කිරීම සහ ජාතික වත්කමක් ලෙස එය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම ;

(ආ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයට අදාළ සියලු පහසුකම් සහ සේවා නඩත්තු කර ගෙන යාම ;

(ඇ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයට අයත් ගොඩනැගිලිවලට සහ ව්‍යුහවලට අවශ්‍ය වන වැඩිදියුණු කිරීම් හෝ වෙනස් කිරීම් සිදු කිරීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ක්‍රීඩාවෙහි ස්වකීය හැකියාව වැඩිදියුණු කර ගැනීමට සහ ඔවුන්ගේ කායවර්ධනය සහ සෞඛ්‍යය වැඩිදියුණු කර ගැනීමට හැකි වන සේ, මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පහසුකම් ඔවුනට ලබාදීම ;

(ඉ) විශේෂයෙන්ම ග්‍රාමීය අංශවල ක්‍රීඩා වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ක්‍රීඩා පිළිබඳ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් පවත්වාගෙන යාම ;

(ඊ) ජාතික සහ අන්තර් ජාතික උත්සව සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පහසුකම්, මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ලබාදීම ;

(උ) ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ විනෝදාංශ පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, ජාත්‍යන්තර සහ දේශීය ක්‍රීඩා පුහුණු සංවිධාන සහ ක්‍රීඩා ආයතන සමඟ සම්බන්ධීකරණය සහ සම්බන්ධතා ඇති කර ගැනීම ;

(ඌ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පහසුකම්, මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව, සාධාරණ ගාස්තුවකට පාසැල්වලට, තරුණ ක්‍රීඩා සමාජවලට සහ ක්‍රීඩා සංවිධානවලට සැපයීම.

**5.** අධිකාරියට පහත දැක්වෙන බලතල ඇත්තේ ය :— අධිකාරියේ බලතල.

(අ) චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීමට හා දැරීමට සහ ඒ දේපළ බැහැර කිරීමට, විකිණීමට, උකස් කිරීමට, බදුදීමට හෝ කුලියට දීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමට ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් බැහැර හෝ පිහිටි යම් ආණ්ඩුවකින්, තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින්, චංචල හෝ නිශ්චල දේපළ, ප්‍රදානයන් වශයෙන්, ත්‍යාග වශයෙන් හෝ පරිත්‍යාග වශයෙන් භාරගැනීමට ;

(ඇ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සෑම කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට ඇතුළත්වීමට සහ ඒවා ඉටු කිරීමට ;

(ඈ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට සහ ඒ නිලධරයන් හා සේවකයන්ගේ විනය පාලනය කිරීමට සහ ඔවුන් සේවයෙන් පහකිරීමට ;

(ඉ) එකී නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීමට සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි තීරණය කිරීමට ;

(ඊ) අධිකාරිය විසින් ඉටු කරන ලද හෝ සපයන ලද සේවා සහ පහසුකම් සඳහා ගාස්තු අය කිරීමට ;

(උ) පොළී ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට හෝ ලබාගැනීමට ;

(ඌ) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා පුහුණු පාඨමාලා, වැඩමුළු හා සම්මේලන පැවැත්වීමට ;

(එ) ප්‍රයෝජනයට නොගන්නා අධිකාරියේ අරමුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට ;

(ඒ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා කිරීමට.

II වන කොටස

## කාර්ය මණ්ඩලය

අධිකාරියේ බලතල පවරා දීම.

**6**. (1) මේ පනතින් අධිකාරිය වෙත පවරා දී ඇති, පනවා ඇති හෝ නියමකොට ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, අධිකාරියේ කටයුතු කාර්යක්ෂමව කර ගෙන යාම පිණිස, මණ්ඩලය විසින් ලිඛිතව නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත්ව, අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත මණ්ඩලය විසින් පවරා දෙනු ලැබිය හැකි ය.

(2) එසේ කරනු ලැබූ යම් පැවරීමක් තිබුණේ වුවද ඒ ගැන නොතකා ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු, ඉටු කරනු හෝ සිදු කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**7**. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට යම් රජයේ නිලධරයකු විසින් දෙනු ලබන කැමැත්ත සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, ඒ නිලධරයා, එවැනි ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයකට අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ, එම කාර්ය මණ්ඩලයට ස්ථිරව ම හෝ පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කර ගනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කර ගනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තිය, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

(4) එක්තරා නිශ්චිත කාලපරිච්ඡේදයක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරන ලද යම් සේවා කාලයක්, එකී ගිවිසුම යටතේ තම බැඳීම ඉටු කිරීම් වස් ඒ තැනැත්තා විසින් ආණ්ඩුවට කරන ලද සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

## මුදල්

8. (1) අධිකාරියට තමාගේ ම අරමුදලක් තිබිය යුතු ය. අධිකාරියේ අරමුදල.

(2) ඒ අරමුදල, ( මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන )"සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ අරමුදල" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

(3) පහත දැක්වෙන මුදල්,ඒ අරමුදලට ගෙවනු ලැබිය යුතු යː—

(අ) 1995 ඔක්තෝබර් 25 වන දින දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර පිහිටුවනු ලැබූ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ භාර අරමුදලේ බැරට නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී තිබුණු සියලු මුදල් ප්‍රමාණ ;

(ආ)අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වාර්ෂිකව වෙන් කරනු ලබන සියලු මුදල් ප්‍රමාණ ;

(ඈ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණ ;

(ඇ) අධිකාරිය විසින් ඉටු කරනු ලබන සේවා හෝ සපයනු ලබන පහසුකම් හෝ සම්බන්ධයෙන් ගාස්තු වශයෙන් හෝ, මේ පනත යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ ලැබෙන සියලු මුදල් ප්‍රමාණ.

(4) පහත දැක්වෙන මුදල් ප්‍රමාණ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් කරනු ලබන යම් වියදමක් දැරීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණ ;

(ආ) අරමුදලින් ගෙවිය යුතු යයි මේ පනතේ යම් විධිවිධානයක් මගින් නියම කරනු ලබන සියලු මුදල් ප්‍රමාණ ; සහ

(ඇ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාර අරමුදලේ බැරකම් කිසිවක් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී නොගෙවා පැවතියා වූ ද, සියලු මුදල් ප්‍රමාණ.

ගිණුම් සහ විගණනය.

**9**. (1) අධිකාරියේ ලැබීම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් ගණුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් කටයුතු යෙදිය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව, අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) ලිත් වර්ෂය, අධිකාරියේ මුදල් වර්ෂය වේ.

1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන කොටස අදාළ වීම.

**10**. 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන කොටස. සැක දුරුකිරීම සඳහා, අධිකාරියට අදාළ කරනු ලබන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

## IV වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

**11**. අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ හෝ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත ලිඛිතව දෙනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් ඒ විධාන අනුව ක්‍රියා කිරීම මණ්ඩලය සතු කාර්ය විය යුතු ය.

අධිකාරියේ නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**12**. අධිකාරියේ සියලුම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් බව.

**13**. අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර,ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

**14**. (1) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ මණ්ඩලයේ සාමාජිකයකු හෝ අධිකාරියේ නිලධරයකු හෝ සේවකයකු හෝ විසින් සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ පවරනු ලැබූ යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් ගෙවනු ලැබිය අතර, එවැනි යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක පවරනු ලැබූ යම්

සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී, ඒ ක්‍රියාව කර ඇත්තේ සද්භාවයෙන් බව ඒ අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා විසින් ඒ සිවිල් නඩුවේදී හෝ අපරාධ නඩුවේදී දරනු ලැබූ යම් වියදමක් ඒ තැනැත්තා විසින් ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේදී අයකර ගෙන නැත්නම් ඒ වියදම අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නියෝගය.

**15**. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දින සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට ඒ නියෝගය ක්‍රියාත්මක වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් වේ නම්, ඒ නියෝගය යටතේ ඊට කලින් කරනු ලැබූ යම් දෙයකට අගතියකින් තොරව, එකී නියෝගය , එකී අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

**16**. (1) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ කාර්ය සඳහා සේවයේ නියුක්ත කරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සේවයේ නියුක්තව සිටියා වූ සෑම තැනැත්තකුට ම, එකී නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඒ තැනැත්තා භුක්ති විඳිමින් සිටි නියමයන්ට සහ කොන්දේසිවලට අඩු වාසිදායක නොවන නියමයන් සහ කොන්දේසි මත අධිකාරියේ සේවා නියුක්තිය අර්පණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අර්පණයක් භාර නොගන්නා යම් තැනැත්තෙකුට, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන වන්දි මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ —

අර්ථ නිරූපණය.

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ වන පරිච්ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ.

"සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය" යන්නෙන්,මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නියම කොට ඇති ප්‍රදේශය තුළ පිහිටි ඉඩම සහ ගොඩනැගිලි අදහස් වේ.

පළමුවන උපලේඛනය [**3 (4)** වන වගන්තිය]

1. යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු වේ නම් ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් සිටීමට හෝ නුසුදුසු වන්නේ ය.

2. මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් කිසිදු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

3. මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දිනයේ සිට එය බලාත්මක වන්නේ ය.

4. **2** වන සහ **3** වන ඡේදවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුගේ ධුර කාලය, ඔහු පත් කළ දින සිට වර්ෂ තුනක කාලය වන්නේ ය.

5. පත් කළ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතුකොට ගෙන තම ධුරය හිස් කරන අවස්ථාවක දී, ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලැබූ තැනැත්තා අනුප්‍රාප්ත වූයේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද

ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ශේෂ වී ඇති කාලය සඳහා පමණක් ඒ තැනැත්තා විසින් ධුරය දැරිය යුතු ය.

6. රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ සභාපතිවරයාට හෝ පත් කළ සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු හෝ යට කී සාමාජිකයා වෙනුවෙන් කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු හෝ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

7. මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු ධුර කාලය ඉකුත්වීම හේතුකොට ගෙන තම ධුරය හිස් කරන අවස්ථාවක දී ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

8. අමාත්‍යවරයා විසින්, කිසිදු හේතුවක් නොදක්වා මණ්ඩලයේ සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

9. අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් මණ්ඩලයේ සභාපතිවරයාට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් භාරගනු ලැබූ දින සිට එය බලාත්මක වන්නේ ය.

10. 8 වන සහ 9 වන ඡේදවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන ධුර කාලය වන්නේ ය.

11.මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික, මණ්ඩලයේ සියලු ම සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට හෝ අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

12.(අ) මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවක දී, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(ආ) සාමාජිකයන් සිව්දෙනකුගෙන් මණ්ඩලයේ කවර වුවද රැස්වීමක ගණපූරණය සිදුවේ.

(ඇ) ඉහත (අ) සහ (ආ) වන අනුඡේදවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කාරණා පිළිබඳ කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කර ගනු ලැබිය හැකි ය.

13. මණ්ඩලය යටත් පිරිසෙයින් මාසයකට එක් වරක්වත් රැස්විය යුතු ය.

14. මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත් කිරීමේ ලා යම් දෝෂයක් තිබීම කරණකොට ගෙනම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් අවලංගු නොවන්නේ ය.

15. (අ) අධිකාරියට මුද්‍රාවක් තිබිය යුතු ය.

(ආ) මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස අධිකාරියේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට තම අත්සන් යෙදිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.